සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General } 3888022 3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin) } 2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement) } 2877891

ෆැක්ස්
பெக்ஸ்
Fax } 2877890

ඊමේල්-
மின்னஞ்சல்
E-Mail } excisen@slt.lk

දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No } 2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර ,රාජගිරිය .இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය. எனது இல: My No. } ED/02/2/15-II

ඔබේ අංකය. உமது இல: Your No. }

දිනය திகதி Date } 2020.11. 17

සු.කො./නි.සු.කො./ස.සු.කො./සු.අධිකාරි/
සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්
සුරාබදු පරීක්ෂකවරුන් වෙත

**<u>ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂක තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා ඉල්ලුම්පත් කැඳවීම - 2017 දෙවන භාගය</u>**

සුරාබදු පරීක්ෂකවරුන් වෙනුවෙන් 2017 දෙවන භාගයේදී පැවැත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත.

02.ඒ අනුව, මෙම විභාගයට අදාළ ලිඛිත පරීක්ෂණය ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ද වාචික පරීක්ෂණය සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ද පවත්වනු ලැබේ.

සුරාබදු පරීක්ෂකවරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම - ඩී I (ලිඛිත), ඊ I (ලිඛිත) හා සී (වාචික) පරීක්ෂණ

සුරාබදු පරීක්ෂකවරුන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම - ඩී II (ලිඛිත), ඊ II (ලිඛිත), ජී (ලිඛිත) සහ අයි (වාචික) පරීක්ෂණ

යථෝක්ත විභාගය සඳහා අනුගමනය කරනු ලබන විභාග පරිපාටිය පහත දැක්වේ.

දෙපාර්තමේන්තු නියෝග 377 හා 378 අනුව සුරාබදු පරීක්ෂකවරුන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

03. විෂය නිර්දේශය :-

03.1 <u>පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පහත විෂයයන් ඇතුළත් වේ.</u>

(අ) ඩී I පරීක්ෂණය : (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

i. සුරාබදු ආඥා පනත, වස විෂ අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත ඇතුළත් සුරාබදු අත්පොත III වැනි කොටස (නීතිය) සංශෝධනය සහිතව
ii. දෙපාර්තමේන්තු නියෝග ඇතුළත් සුරාබදු අත්පොත I වැනි කොටස
iii. ස්කාගාර හා ගුදම් මූලික කාර්මික දැනුම සුරාබදු අත්පොත 2 වැනි කොටස (III පරිච්ඡේදයේ 17,18 වගන්තිවලට විශේෂ අවධානය යොමු කෙරේ).
iv. සුරාබදු නිවේදන ඇතුළත් සුරාබදු අත්පොත IV වැනි කොටස හා ඉන්පසු නිකුත් කර ඇති සියලුම සුරාබදු නිවේදන

(ආ) ඊ I පරීක්ෂණය : (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

අපරාධ නඩු විධාන සංග්‍රහය, ලංකා දණ්ඩ නීති සංග්‍රහය හා සාක්ෂි ආඥාපනත සම්බන්ධව දෙපාර්තමේන්තු නියෝග 378 හි ඇතුළත් පරිදි එකී විෂය නිර්දේශය.

(ඇ) සී පරීක්ෂණය : (වාචික පරීක්ෂණයකි)

සිංහල /දෙමළ භාෂා කථා කිරීමේ හා තේරුම් ගැනීමේ හැකියාව මැනීම.
(දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පැවැත්වේ)

| විෂය | විෂය අංකය | කාලය | ලකුණු | සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| ඩී I පරීක්ෂණය | 01 | පැය 03 | 100 යි | 40 |
| ඊ I පරීක්ෂණය | 02 | පැය 03 | 100 යි | 40 |
| සී පරීක්ෂණය | 03 | පැය 1/2 | 100 යි | 40 |

03.2 <u>දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පහත විෂයයන් ඇතුළත් වේ.</u>

(ඇ) ඩී II පරීක්ෂණය : (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

i. සුරාබදු ආඥාපනත, වස විස, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥාපනත ඇතුලත් සුරාබදු අත්පොත III වැනි කොටස (නීතිය) සංශෝධනය සහිතව
ii. දෙපාර්තමේන්තු නියෝග ඇතුලත් සුරාබදු අත්පොත I වන කොටස
iii. සුරාබදු නිවේදන ඇතුලත් සුරාබදු අත්පොත IV කොටස හා ඉන් පසු නිකුත් කර ඇති සියලුම සුරාබදු නිවේදන

(ඉ) ඊ II පරීක්ෂණය : (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

අපරාධ නඩු විධාන සංග්‍රහය, ලංකා දණ්ඩ නීති සංග්‍රහය හා සාක්ෂි ආඥාපනත සම්බන්ධව දෙපාර්තමේන්තු නියෝග 378 හි ඇතුළත් පරිදි එකී විෂය නිර්දේශය. (ඉහළ මට්ටමක දැනුමක් අපේක්ෂා කෙරේ.)

(ඊ) ජී පරීක්ෂණය : (පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි)

i. කාර්මික සංග්‍රහය (සුරාබදු අත්පොත II වැනි කොටස )
ii. ආයතන සංග්‍රහයේ පළමු කාණ්ඩයේ I, XII, XIV, XXVIII, XXXIII පරිච්ඡේද
iii. මුදල් රෙගුලාසි සංග්‍රහයේ II, IV, V, VI , හා XIII පරිච්ඡේද

(ඊ) අයි පරීක්ෂණය : (වාචික පරීක්ෂණයකි)

ප්‍රායෝගික දැනුම මැනීමේ වෘත්තීමය පරීක්ෂණයකි.

| විෂය | විෂය අංකය | කාලය | ලකුණු | සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|---|---|
| ඩී II පරීක්ෂණය | 01 | පැය 03 | 100 යි | 40 |
| ඊ II පරීක්ෂණය | 02 | පැය 03 | 100 යි | 40 |
| ජී පරීක්ෂණය | 03 | පැය 03 | 100 යි | 40 |
| අයි පරීක්ෂණය | 04 | පැය 1/2 | 100 යි | 40 |

04. අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීම :-

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව අපේක්ෂකයින් විසින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.

ඒ අනුව, පිළියෙල කරන ලද අයදුම් පත්‍රය අපේක්ෂකයින් විසින් අදාල අධීක්ෂණ නිලධාරීන් මගින් 2020.12.18 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, නො.353, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

04.1 විභාග ගාස්තු :-

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය සඳහා හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාවකට සම්පූර්ණ විභාගය සඳහා රු.500.00

(ඇ) එක් විෂයකට පමණක් පෙනී සිටීම සඳහා රු.200.00

05. යම් අපේක්ෂකයෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිව විභාගයට ඉදිරිපත් වුවහොත් ඔහුගේ/ ඇයගේ ප්‍රතිඵල වලංගු සේ පිළිනොගැනේ.

06. සුදුසුකම් ලත් විභාග අපේක්ෂකයින්ට විභාග අංකය, විභාගය පැවැත්වෙන දිනය හා වේලාව අයදුම්පත්වල සඳහන් රාජකාරි ලිපිනය අනුව දැනුම් දෙනු ලැබේ. ලිපිනයේ වෙනසක් සිදුවුවහොත් වහාම ඒ බව මා වෙත දැනුම් දිය යුතුය.

ජ්. බෝදරගම
සුරාබදු කොමසාරිස් ජනරාල්

ජේ. බෝදරගම
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත්:-1. ප්‍රධාන ගණකාධිකාරි - කරු.දැ.ගැ.ස.

2. සියළුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්/සුරාබදු අධිකාරිවරුන් -

විභාග අපේක්ෂකයින් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල් වෙනුවෙන් පොදු 172 ලදුපතක් නිකුත් කළ යුතු අතර එසේ එකතු වන මුදල් ලංකා බැංකුවේ තැපෝබේන් ශාඛාවේ අංක 0007041628 දරණ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කර අදාල විස්තර 2020.12.18 දිනට පෙර ප්‍රධාන ගණකාධිකාරී වෙත වාර්තා කළ යුතුය.